## 436 නීල අහසේ

නීල අහසේ තරු බබලන්නේ
ගීත රාවෙන් ලොව පිබිදෙන්නේ
සාම කුමරුන් අප වෙත වඩිනා
ශ්‍රී සුභ නත්තල මේ

සගපුර දෙව්දූට මහිමය වන්නයි
සුසිත් දනන් හට සාමය වන්නයි
ලෝ සත සැම හට සෙත සලසන්නයි
මේ නත්තල් දිනයේ

ආසිරි ගී නද ලොව පැතිරෙන්නේ
ගැලවීමේ හඬ රැව් පිළිදෙන්නේ
ලොවටම සාමය උදා කරන්නේ
මේ නත්තල් දිනයේ